*සැ. යු.-* 2022.12.09 දින පළ කරන ලද අංක 2310 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,311 - 2022 දෙසැම්බර් මස 16 වැනි සිකුරාදා - 2022.12.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 876 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 ජනවාරි මස 06 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 දෙසැම්බර් මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම

**මීගමුව දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

බ්‍රෙෂියා ග්‍රාමීන් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 88/2, හලාවත පාර, කට්ටුව, මීගමුව

............*පැමිණිලිකරු.*

නඩු අංකය : 3925/MB
ස්වභාවය : උකස්
කාර්ය පටිපාටිය : සාමාන්‍ය
ඇස්කීසි අංකය : 105/2022

එදිරිව

උළුවන වත්තේ ගෙදර රාජකරුණලාගේ රුක්මාල් චතුරංග
288/සී, මිරිස්වත්ත, දෙමන්හන්දිය

............*විත්තිකරු.*

ඉහත අංකය දරන නඩුවේ වර්ෂ 2021ක් වූ ජූලි මස 26 වැනි දින දරන සමථ තීන්දු ප්‍රකාශය ප්‍රකාරව විත්තිකරුගෙන් පැමිණිලිකාර සමාගම වෙත අයකර ගන්නට කියා නියම කොට තීන්දු ප්‍රකාශය කරන ලද රුපියල් විසිතුන්ලක්ෂ තිස්දෙදහස් හයසිය විසිහයයි ශත තිස්හයක (රු. 2,332,626.36) මුදලක් මේ දක්වා ඉහත නම සඳහන් විත්තිකරු විසින් ගෙවා නොමැති බැවින් මෙම නඩුවේ ඇස්කිසි ක්‍රියාවේ යෙදවීමේ බලපත්‍රයක් නිකුත්කර අධිකරණයෙන් නැවත වැඩිදුරටත් ආඥාවක් ලැබෙන තෙක් මෙයට යා කොට ඇති උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ යම් ලෙසකින් පැවරීම, අන්සතු කිරීම හෝ වැය බරකට යටත් කිරීම, ඒ සම්බන්ධයෙන් යම් ලේඛන ඉදිරිපත් කිරීම හෝ ලියාපදිංචි කිරීම හෝ උපදෙස් දීම එකී විත්තිකරුහට තහනම් කර එයින් වළක්වන ලද හෙයින් සහ එයින් හෝ ඉන් කොටසක් මුදලට හෝ ත්‍යාග වශයෙන් අන් ක්‍රමයකට ලබාගැනීම සියල්ලන්ට ම තහනම් කරන ලද හෙයින්,

වර්ෂ **2023ක්** වූ ජනවාරි මස **13** වැනි දින ප. ව. **2.30ට** එකී දේපළ පිහිටි ස්ථානයේ දී පිස්කල් වෙන්දේසියේ විකුණනු ලැබේ.

එකී වෙන්දේසියේ දී ඉහලම ලංසු තබන්නා ගැණුම්කරුවන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් මුළු ගැනුම් මිලෙන් 25%ක මුදලක් ද, පිස්කල් ගාස්තු ද රජයට අයවිය යුතු ගාස්තු, වෙන්දේසි ගාස්තු, *ගැසට් පත්‍රයේ* ගාස්තු සහ පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් ද, අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වූ වියදම් ද එවලේ ම මුදලින් මා වෙත ගෙවිය යුතුය. චෙක්පත් බාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් 75%ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත මීගමුව දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට අයත්, අලුත්කුරු කෝරළයේ, දූනගහපත්තුවේ, කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ, කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ, අංක 94 බටහිර කලුවාරිප්පුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයට අයත්, බටහිර කලුවාරිප්පුව පිහිටි ගොඩපරගහවත්ත නැමැති ඉඩමට පී. ඥානප්‍රගාසම් බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 10245 සහ 2012.03.29 දින දරන පිඹුර ප්‍රකාර බෙද වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් එනම්, උතුරට : එස්. එම්. දිසානායක මානක තැනගේ අංක 6041 පිඹුරේ කැබලි අංක 02 දරන කොටස ද, නැගෙනහිරට : පාර ද, දකුණට : පාර ද එස්. එම්. දිසානායක මානක තැනගේ අංක 6041 පිඹුරේ කැබලි අංක 04 දරන කොටස ද, බස්නාහිරට : කේ. කේ. නිස්සංක පෙරේරා සතු ඉඩම ද යන මෙකී මායිම් තුළ පිහිටි, පර්චස් එකොළහයි දශම හයක් (පර්. 11.6) විශාල ඉඩම සහ ඊට අයත් සියලු දේත් වේ. මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක H 236/61 දරන වෙලුමේ සහ පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

*දේපළට පිවිසීම* : මීගමුව දිවුලපිටිය පාරේ (242 බස් මාර්ගයේ) මිරිස්වත්ත හංදියෙන් වමට හැරී කටාන පාරේ මීටර් 150 ක් පමණ ගොස් වම් අත දෙසට ඇති ගල්වල පාරේ මීටර් 50 පමණ ගොස් කනත්ත අසලින් වම් අත දෙසට ඇති පාරේ මීටර් 100 ක් පමණ ගොස් පාරේ ඇති අවසන් නිවස.

එම්. එම්. කේ. ශ්‍රීයාන්ත,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
මීගමුව.

වර්ෂ 2022 ක් වූ නොවැම්බර් මස 17 වැනි දින දී ය.

12-339

**සිවිල් අධිකරණ බලය ක්‍රියාවට නංවමින් කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණයේ දීය.**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

කොළඹ 06, කිරුළපන, එඩ්මන්ටන් පාර, අංක 12 හි පිහිටි පළමු වැනි කොළඹ නගර ශාඛාව කිරුළපන දීර්ඝ කිරීමේ මධ්‍යස්ථානය (1st Colombo City Branch Kirulapone Extention Center) යනුවෙන් හඳුන්වන කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇති,
සණස සංවර්ධන බැංකුව (සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී. එල්. සී.)

නඩු අංකය : HC/CIVIL/7/14/MR

............*පැමිණිලිකාර බැංකුව.*

-එදිරිව-

රෙනයිසන්ස් නිවාස පුද්ගලික සමාගම,
අංක 151,
නාවල පාර, නුගේගොඩ,
සහ/හෝ
අංක 1/ඒ/1,
පන්නිපිටිය පාර, ජයන්තිපුර,
බත්තරමුල්ල.

............*විත්තිකාර සමාගම.*

ඉහත නම් සඳහන් විත්තිකාර සමාගම වෙතය.

මෙම නඩුවෙහි වර්ෂ 2016ක් වූ නොවැම්බර් මස 21 වන දින ඇතුළත් කරන ලද ඒක පාර්ශ්වික තීන්දුවේ තීන්දු ප්‍රකාශය ප්‍රකාරව,

එකී වර්ෂ 2016 ක් වූ නොවැම්බර් මස 21 වන දින ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය ප්‍රකාරව පැමිණිල්ලේ වාසියට තීන්දු ප්‍රකාශ කර ඇති අතර, එකී තීන්දුව ප්‍රකාර මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ ලියා තහනමට ගෙන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා පැමිණිලිකරුට එකී තීන්දු ප්‍රකාශය ප්‍රකාරව හිමිවිය යුතු රුපියල් 4,750,000 ක ණය මුදල ද, එම ණය මුදල උදෙසා වර්ෂ 2013.05.23 දින දක්වා වාර්ෂිකව 22% බැගින් වූ පොළියේ ද, එකතුව වන රුපියල් 5,161,871.22 ක මුදල ද, හා 2013.05.24 දින සිට ඉහත කී ණය මුදල සම්පූර්ණයෙන් ම විත්තිකාර සමාගමෙන් අයකර ගන්නා තුරු රුපියල් 4,750,000 ක මුදල උදෙසා වාර්ෂිකව 22% බැගින් වු පොළී මුදලක් ද, අයකර දෙන ලෙසට නියෝග කර ඇති හෙයින්,

මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම සහ ස්ථානය එකී මුදල් ප්‍රමාණය ගෙවීම සඳහා බන්ධනය වී ඇස්කීසි කළ හැකි බවට ගරු අධිකරණය විසින් තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින්,

එලෙස තීන්දු කරන ලද ඒකපාර්ශවික තීන්දුව අනුව, විත්තිකාර සමාගම විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින්, එකී මුදල් අයකර දීම සඳහා කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ ආඥාව ප්‍රකාර මෙහි පහත සඳහන් පළමු උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම (කැබලි අංක 01) හා ඒ මත පිහිටි ගොඩනැගිලි ගහ කොළ ආදී සියලු දේ.

වර්ෂ **2022ක් වූ දෙසැම්බර් මස 26 වන දින පෙ. ව. 10.00**ට එකී දේපළ පිහිටා ඇති උඩුගම්පොල, දොළගත පාර, යන ස්ථානයේ දී ද,

**පළමු උපලේඛනය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ උඩුගම්පොල ප්‍රාදේශීය සභා සීමාව තුළ අලුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ උඩුගම්පොළ පිහිටි කෝන්ගහවත්ත කියන ඉඩමට (බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක මහතා විසින් වර්ෂ 2012.01.12 වන දින මැන සාදන ලද අංක 11672 දරන පිඹුරේ කැබලි අංක A දරන කොටස නැවත මැන බෙදීමට අනුව) අවසරලත් මිනින්දෝරු මර්වින් සමරනායක විසින් වර්ෂ 2012 පෙබරවාරි මස 13 වන දින මැන සාදන ලද අංක 11707 දරන පිඹුරේ කැබලි අංක 1 දරන කොටසට මායිම් උතුරට : කැබලි අංක 27 ද, නැගෙනහිරට : කැබලි අංක 22 ද, දකුණට : කැබලි අංක 30 ද, බස්නාහිරට : නලින් පෙරේරාට අයත් ඉඩම ද මායිම් වූ පර්චස් දහයක් (පර්. 10) විශාල ඉඩම වේ.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K/143/43 අංක දරන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

මෙහි පහත සඳහන් දෙවන උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම (කැබලි අංක 6) හා ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ ආදී සියලු දේ,

වර්ෂ **2022ක් වූ දෙසැම්බර් මස 26 වැනි දින පෙ. ව. 11.00** ට එකී දේපළ පිහිටා ඇති උඩුගම්පොල, දොළගත පාර යන ස්ථානයේ දී ද,

**දෙවන උපලේඛනය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ උඩුගම්පොළ ප්‍රාදේශීය සභා සීමාව තුළ අලුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ උඩුගම්පොළ පිහිටි කෝන්ගහවත්ත කියන ඉඩමට (බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක මහතා විසින් වර්ෂ 2012.01.12 වන දින මැන සාදන ලද අංක 11672 දරන පිඹුරේ කැබලි අංක A දරන කොටස නැවත මැන බෙදීමට අනුව) අවසරලත් මිනින්දෝරු මර්වින් සමරනායක මහතා විසින් වර්ෂ 2012 පෙබරවාරි මස 13 වන දින මැන සාදන ලද අංක 11707 දරන පිඹුරේ කැබලි අංක 6 දරන කොටසට මායිම් උතුරට : කැබලි අංක 13 ද, නැගෙනහිරට : කැබලි අංක 7 ද, දකුණට : කැබලි අංක 30 ද, බස්නාහිරට : කැබලි අංක 13 ද යන මායිම් වූ පර්චස් දහයක් (අ.0, රූ. 0, පර්. 10) විශාල ඉඩම වේ.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K/143/50 අංක දරන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

මෙහි පහත සඳහන් තුන්වන උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම (කැබලි අංක 7) හා ඒ මත පිහිටි ගොඩනැගිලි ගහ කොළ ආදී සියලු දේ.

වර්ෂ **2022ක් වූ දෙසැම්බර් මස 26 වැනි දින ප.ව. 12.00**ට එකී දේපළ පිහිටා ඇති උඩුගම්පොළ, දොළගත පාර යන ස්ථානයේ දී ද,

**තුන්වන උපලේඛනය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ උඩුගම්පොළ ප්‍රාදේශීය සභා සීමාව තුළ අලුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ උඩුගම්පොළ පිහිටි කෝන්ගහවත්ත කියන ඉඩමට (බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක මහතා විසින් වර්ෂ 2012.01.12 වන දින මැන සාදන ලද අංක 11672 දරන පිඹුරේ කැබලි අංක A දරන කොටස නැවත මැන බෙදීමට අනුව) අවසරලත් මිනින්දෝරු මර්වින් සමරනායක විසින් වර්ෂ 2012 පෙබරවාරි මස 13 වන දින මැන සාදන ලද අංක 11707 දරන පිඹුරේ කැබලි අංක 7 දරන කොටසට මායිම් උතුරට : කැබලි අංක 13 ද, නැගෙනහිරට : කැබලි අංක 8 ද, දකුණට : කැබලි අංක 30 ද, බස්නාහිරට : කැබලි අංක 6 ද, යන මායිම් වූ පර්චස් දහයයි (අ. 0, රූ. 0, පර්. 10) විශාල ඉඩම වේ.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K/143/51 අංක දරන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

මෙහි පහත සඳහන් හතර වන උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම (කැබලි අංක 9) හා ඒ මත පිහිටි ගොඩනැගිලි ගහ කොළ ආදී සියලු දේ,

වර්ෂ **2022ක් වූ දෙසැම්බර් මස 26 වැනි දින ප. ව. 2.00**ට එකී දේපළ පිහිටා ඇති උඩුගම්පොළ, දොළගත පාර යන ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

**හතරවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, උඩුගම්පොළ ප්‍රාදේශීය සභා සීමාව තුළ අලුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ උඩුගම්පොළ පිහිටි කෝන්ගහවත්ත කියන ඉඩමට (බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක මහතා විසින් වර්ෂ 2012.01.12 වන දින මැන සාදන ලද අංක 11672 දරන පිඹුරේ කැබලි අංක A දරන කොටස නැවත මැන බෙදීමට අනුව) අවසරලත් මිනින්දෝරු මර්වින් සමරනායක විසින් වර්ෂ 2012 පෙබරවාරි මස 13 වන දින මැන සාදන ලද අංක 11707 දරන පිඹුරේ කැබලි අංක 09 දරන කොටසට මායිම් උතුරට : කැබලි අංක 13 ද, නැගෙනහිරට : කැබලි අංක 13 ද, දකුණට : කැබලි අංක 30 ද, බස්නාහිරට : කැබලි අංක 8 ද යන මායිම් වූ පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල ඉඩම වේ.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K /143/52 හි ලියාපදිංචි වී ඇත.

ඉහත කී දේපළ කොටස් පහත සඳහන් ඉඩමෙන් බෙදා වෙන් කරන ලදී.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ උඩුගම්පොළ ප්‍රාදේශීය සභා සීමාව තුළ අලුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ උඩුගම්පොළ පිහිටි කෝන්ගහවත්ත කියන ඉඩමට (බලයලත් මිනින්දෝරු වී. එෆ්. ජේ. ප්‍රනාන්දු මහතා විසින් වර්ෂ 1978.11.14 වන දින මැන සාදන ලද අංක 6796 A දරන පිඹුරේ කැබලි අංක A දරන කොටස නැවත මැන බෙදීමට අනුව) අවසරලත් මිනින්දෝරු මර්වින්

සමරනායක විසින් වර්ෂ 2012 ජනවාරි මස 12 වන දින මැන සාදන ලද අංක 11672 දරන පිඹුරේ කැබලි අංක A දරන කොටසට මායිම් උතුරට : සුනිල් පෙරේරාට හා අනෙකුත් අයට අයත් ඉඩම ද, නැගෙනහිරට : මෙම ඉඩමේ කොටසක් වන 11672 දරන පිඹුරේ කැබලි අංක B ද, දකුණට එක්සත් මාවත (පවතින පාර) එම්. ජේ සී. පෙරේරාට අයිති ඉඩම ද, බස්නාහිරට : නලින් පෙරේරාට හා ඩේවිඩ් සිගේරාට අයිති ඉඩම ද, යන මායිම් වූ අක්කර දෙකයි පර්චස් හයයි දශම එකයි (අ. 2, රූ. 0, පර්. 6.1) විශාල ඉඩම වේ.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A468/104 අංක දරන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

1. මුළු ගැණුම් මිලෙන් 25%ක මුදලක් ද,
2. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258(ආ) වගන්තිය යටතේ අයකිරීම් ද,

(ඉහත සඳහන් ගෙවීම් සෑම බිම් කොටසකට ම වෙන් වෙන් වශයෙන් ගෙවිය යුතුය.)

විකිණීම අවසන් වූ වහාම මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25%ක මුදලක් පමණක් නම්, ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75%ක මුදල දින 30ක් ඇතුළත කොළඹ, වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

*දේපළට පිවිසීම* : ගම්පහ නගරයේ සිට මීනුවන්ගොඩ මාර්ගයේ උඩුගම්පොළ මංසන්ධියෙන් වම්පසට ඇති කොටුගොඩ මාර්ගයේ කි. මී. 1ක් පමණ ඉදිරියට ගොස් සෙනරත් පරණවිතාන පාසල ඉදිරියෙන් ඇති දොළගත පාරේ මීටර් 700 ක් පමණ ඉදිරියට ගොස් වම් පස ඇති වරිපනම් අංක 89 A දරන නිවස ඉදිරියෙන් ඇති පාරට හැරී මීටර් 300ක් පමණ ඉදිරියට ගිය පසු වම්පස මෙම කැබලි කරන ලද ඉඩම පිහිටා ඇත.

ආර්. කේ. ගාමිණී වීරසිරි, B. Com (SPL)
අධිකරණ රෙජිස්ට්‍රාර් - නියෝජ්‍ය පිස්කල්.
සාම විනිසුරු (මුළු දිවයිනටම)
වාණිජ මහාධිකරණය,
කොළඹ 12.

වර්ෂ 2022 ක් වූ දෙසැම්බර් මස 05 වැනි දින,
කොළඹ, වාණිජ මහාධිකරණයේ දී ය.

12-436/1

---

**සිවිල් අධිකරණ බලය ක්‍රියාවට නංවමින් කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණයේ දී ය.**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

කොළඹ 06, කිරුළපන, එඩ්මන්ටන් පාර, අංක 12 හි පිහිටි පළමු වැනි කොළඹ නගර ශාඛාව කිරුළපන දීර්ඝ කිරීමේ මධ්‍යස්ථානය (1st Colombo City Branch Kirulapone Extention Center) යනුවෙන් හඳුන්වන කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇති,
සණස සංවර්ධන බැංකුව (සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී. එල්. සී.)

නඩු අංකය : HC/CIVIL/7/14/MR ............*පැමිණිලිකාර බැංකුව.*

*-එදිරිව-*

රෙනයිසන්ස් නිවාස පුද්ගලික සමාගම,
අංක 151,
නාවල පාර, නුගේගොඩ,
සහ/හෝ
අංක 1/ඒ/-1,
පන්නිපිටිය පාර, ජයන්තිපුර,
බත්තරමුල්ල.

............*විත්තිකාර සමාගම.*

ඉහත නම් සඳහන් විත්තිකාර සමාගම වෙතය.

මෙම නඩුවෙහි වර්ෂ 2016ක් වූ නොවැම්බර් මස 21 වන දින ඇතුළත් කරන ලද ඒක පාර්ශ්වික තීන්දුවේ තීන්දු ප්‍රකාශය ප්‍රකාරව,

එකී වර්ෂ 2016 ක් වූ නොවැම්බර් මස 21 වන දින ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය ප්‍රකාරව පැමිණිල්ලේ වාසියට තීන්දු ප්‍රකාශ කර ඇති අතර, එකී තීන්දුව ප්‍රකාර මෙහි පහත උපල්බනයේ විස්තර කර ඇති දේපළ ලියා තහනමට ගෙන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා පැමිණිලිකරුට එකී තීන්දු ප්‍රකාශය ප්‍රකාරව හිමි විය යුතු රුපියල් 4,750,000 ක ණය මුදල ද, එම ණය මුදල උදෙසා වර්ෂ 2013.05.23 දින දක්වා වාර්ෂිකව 22% බැගින් වූ පොළියේ ද, එකතුව වන රුපියල් 5,161,871.22 ක මුදල ද, හා 2013.05.24 දින සිට ඉහත කී ණය මුදල සම්පූර්ණයෙන්ම විත්තිකාර සමාගමෙන් අයකර ගන්නා තුරු රුපියල් 4,750,000 ක මුදල උදෙසා වාර්ෂිකව 22% බැගින් වූ පොළී මුදලක් ද, අයකර දෙන ලෙසට නියෝග කර ඇති හෙයින්,

මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම සහ ස්ථානය එකී මුදල් ප්‍රමාණය ගෙවීම සඳහා බන්ධනය වී ඇස්කිසි කළ හැකි බවට ගරු අධිකරණය විසින් තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින්,

එලෙස තීන්දු කරන ලද ඒකපාර්ශවික තීන්දුව අනුව, විත්තිකාර සමාගම විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින්, එකී මුදල් අයකර දීම සඳහා කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ ආඥාව ප්‍රකාර මෙහි පහත සඳහන් පළමු උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම (කැබලි අංක 12) හා ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ ආදී සියලු දේ.

**වර්ෂ 2022ක් වූ දෙසැම්බර් මස 27 වන දින පෙ. ව. 10.00ට** එකී දේපළ පිහිටා ඇති උඩුගම්පොල, දොළගත පාර, යන ස්ථානයේ දී ද,

පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ උඩුගම්පොල ප්‍රාදේශීය සභා සීමාව තුළ අලුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ උඩුගම්පොළ පිහිටි කෝන්ගහවත්ත කියන ඉඩමට (බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක මහතා විසින් වර්ෂ 2012.01.12 වන දින මැන සාදන ලද අංක 11672 දරන පිඹුරේ කැබලි අංක A දරන කොටස නැවත මැන බෙදීමට අනුව) අවසරලත් මිනින්දෝරු මර්වින් සමරනායක විසින් වර්ෂ 2012 පෙබරවාරි මස 13 වන දින මැන සාදන ලද අංක 11707 දරන පිඹුරේ කැබලි අංක 12 දරන කොටසට මායිම් උතුරට : සුනිල් පෙරේරා සහ අනෙකුත් අයට අයත් ඉඩම ද, නැගෙනහිරට : කැබලි අංක 29 ද, දකුණට : කැබලි අංක 31 ද, බස්නාහිරට : කැබලි අංක 14 ද යන මායිම් වූ පර්චස් දහතරයි දශම හයයි බින්දුව (පර්. 14.60) විශාල ඉඩම වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K/143/53 අංක දරන පත්‍ඉරුවේ ලියාපදිංචි වී ඇත.

මෙහි පහත සඳහන් දෙවන උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම (කැබලි අංක 15) හා ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ ආදී සියලු දේ,

**වර්ෂ 2022ක් වූ දෙසැම්බර් මස 27 වැනි දින පෙ. ව. 11.00 ට** එකී දේපළ පිහිටා ඇති උඩුගම්පොල, දෙළගත පාර යන ස්ථානයේ දී ද,

දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ උඩුගම්පොල ප්‍රාදේශීය සභා සීමාව තුළ අලුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ උඩුගම්පොළ පිහිටි කෝන්ගහවත්ත කියන ඉඩමට (බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක මහතා විසින් වර්ෂ 2012.01.12 වන දින මැන සාදන ලද අංක 11672 දරන පිඹුරේ කැබලි අංක A දරන කොටස නැවත මැන බෙදීමට අනුව) අවසරලත් මිනින්දෝරු මර්වින් සමරනායක විසින් වර්ෂ 2012 පෙබරවාරි මස 13 වන දින මැන සාදන ලද අංක 11707 දරන පිඹුරේ කැබලි අංක 15 දරන කොටසට මායිම් උතුරට : සුනිල් පෙරේරාට සහ අනෙකුත් අයට අයත් ඉඩමද, නැගෙනහිරට : කැබලි අංක 14 ද, දකුණට : කැබලි අංක 13 ද, බස්නාහිරට : කැබලි අංක 16 ද යන මායිම් වූ පර්චස් දහයයි දශම දහයක් (අ.0, රූ. 0, පර්. 10.10) විශාල ඉඩම වේ.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K/143/54 අංක දරන පත්‍ඉරුවේ ලියාපදිංචි වී ඇත.

මෙහි පහත සඳහන් තුන්වන උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම (කැබලි අංක 16) හා ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ ආදී සියලු දේ.

**වර්ෂ 2022ක් වූ දෙසැම්බර් මස 27 වැනි දින ප. ව. 12.00ට** එකී දේපළ පිහිටා ඇති උඩුගම්පොළ, දොළගත පාර යන ස්ථානයේ දී ද,

තුන්වන උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ උඩුගම්පොල ප්‍රාදේශීය සභා සීමාව තුළ අලුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ උඩුගම්පොළ පිහිටි කෝන්ගහවත්ත කියන ඉඩමට (බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක මහතා විසින් වර්ෂ 2012.01.12 වන දින

මැන සාදන ලද අංක 11672 දරන පිඹුරේ කැබලි අංක A දරන කොටස නැවත මැන බෙදීමට අනුව) අවසරලත් මිනින්දෝරු මර්වින් සමරනායක විසින් වර්ෂ 2012 පෙබරවාරි මස 13 වන දින මැන සාදන ලද අංක 11707 දරන පිඹුරේ කැබලි අංක 16 දරන කොටසට මායිම්, උතුරට : සුනිල් පෙරේරාට හා අනෙක් අයට අයත් ඉඩම ද, නැගෙනහිරට : කැබලි අංක 15 ද, දකුණට : කැබලි අංක 13 ද, බස්නාහිරට : කැබලි අංක 17 ද, යන මායිම් වූ පර්චස් දහයයි දශම දහයයි (අ. 0, රූ. 0, පර්. 10.10) විශාල ඉඩම වේ.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K/143/55 අංක දරන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

මෙහි පහත සඳහන් හතර වන උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම (කැබලි අංක 18) හා ඒ මත පිහිටි ගොඩනැගිලි ගහ කොළ ආදී සියලු දේ,

**වර්ෂ 2022ක් වූ දෙසැම්බර් මස 27 වැනි දින ප. ව. 2.00** ට එකී දේපළ පිහිටා ඇති උඩුගම්පොළ, දෙළගත පාර යන ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

හතරවන උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ උඩුගම්පොළ ප්‍රාදේශීය සභා සීමාව තුළ අලුත්කුරු කෝරළේ දසිය පත්තුවේ උඩුගම්පොළ පිහිටි කෝන්ගහවත්ත කියන ඉඩමට (බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක මහතා විසින් වර්ෂ 2012.01.12 වන දින මැන සාදන ලද අංක 11672 දරන පිඹුරේ කැබලි අංක A දරන කොටස නැවත මැන බෙදීමට අනුව) අවසරලත් මිනින්දෝරු මර්වින් සමරනායක විසින් වර්ෂ 2012 පෙබරවාරි මස 13 වන දින මැන සාදන ලද අංක 11707 දරන පිඹුරේ කැබලි අංක 18 දරන කොටසට මායිම්, උතුරට : කැබලි අංක 33 ද, නැගෙනහිරට : කැබලි අංක 13 හා 34 ද, දකුණට : කැබලි අංක 35 ද, බස්නාහිරට : කැබලි අංක 19 ද යන මායිම් වූ පර්චස් එකොළහක් (පර්. 11) විශාල ඉඩම වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K 96/09 හි ලියාපදිංචි වී ඇත.

ඉහත කී දේපල කොටස් පහත සඳහන් ඉඩමෙන් බෙදා වෙන් කරන ලදී.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, උඩුගම්පොළ ප්‍රාදේශීය සභා සීමාව තුළ අලුත්කුරු කෝරළේ දසිය පත්තුවේ උඩුගම්පොළ පිහිටි කෝන්ගහවත්ත කියන ඉඩමට (බලයලත් මිනින්දෝරු වී. එෆ්. ජේ. ප්‍රනාන්දු මහතා විසින් වර්ෂ 1978.11.14 වන දින මැන සාදන ලද අංක 6796 A දරන පිඹුරේ කැබලි අංක A දරන කොටස නැවත මැන බෙදීමට අනුව) අවසරලත් මිනින්දෝරු මර්වින් සමරනායක විසින් වර්ෂ 2012 ජනවාරි මස 12 වන දින මැන සාදන ලද අංක 11672 දරන පිඹුරේ කැබලි අංක A දරන කොටසට මායිම් උතුරට : සුනිල් පෙරේරාට හා අනෙකුත් අයට අයත් ඉඩම ද, නැගෙනහිරට : මෙම ඉඩමේ කොටසක් වන 11672 දරන පිඹුරේ කැබලි අංක B ද, දකුණට එක්සත් මාවත (පවතින පාර) එම්. ජේ. සී. පෙරේරාට අයිති ඉඩමද, බස්නාහිරට : නලින් පෙරේරාට හා ඩේවිඩ් සිංගේරාට අයිති ඉඩම ද, යන මායිම් වූ අක්කර දෙකයි පර්චස් හයයි දශම එකයි (අ. 2, පර්. 6.1) විශාල ඉඩම වේ.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A/468/104 අංක දරන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

1. මුළු ගැණුම් මිලෙන් 25%ක මුදලක් ද,
2. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258(අ) වගන්තිය යටතේ අයකිරීම් ද,

(ඉහත සඳහන් ගෙවීම් සෑම බිම් කොටසකට ම වෙන් වෙන් වශයෙන් ගෙවිය යුතුය.)

විකිණීම අවසන් වූ වහාම මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25%ක මුදලක් පමණක් නම්, ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75%ක මුදල දින 30ක් ඇතුළත කොළඹ, වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

*දේපළට පිවිසීම* : ගම්පහ නගරයේ සිට මිනුවන්ගොඩ මාර්ගයේ උඩුගම්පොළ මංසන්ධියෙන් වම් පසට ඇති කොටුගොඩ මාර්ගයේ කි. මී. 1ක් පමණ ඉදිරියට ගොස් සෙනරත් පරණවිතාන පාසල ඉදිරියෙන් ඇති දෙළගත පාරේ මීටර් 700 ක් පමණ ඉදරියට ගොස් වම් පස ඇති වරිපනම් අංක 89 A දරන නිවස ඉදිරියෙන් ඇති පාරට හැරී මීටර් 300ක් පමණ ඉදිරියට ගිය පසු වම්පස මෙම කැබලි කරන ලද ඉඩම පිහිටා ඇත.

ආර්. කේ. ගාමිණී වීරසිරි, B. Com (SPL)
අධිකරණ රෙජිස්ට්‍රාර් - නියෝජ්‍ය පිස්කල්.
සාම විනිසුරු (මුළු දිවයිනටම)
වාණිජ මහාධිකරණය,
කොළඹ 12.

වර්ෂ 2022 ක් වූ දෙසැම්බර් මස 05 වැනි දින,
කොළඹ, වාණිජ මහාධිකරණයේ දීය.

12-436/2

**සිවිල් අධිකරණ බලය ක්‍රියාවට නංවමින් කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණයේ දීය.**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

කොළඹ 06, කිරුළපන, එඩ්මන්ටන් පාර, අංක 12 හි පිහිටි පළමු වැනි කොළඹ නගර ශාඛාව කිරුළපන දීර්ඝ කිරීමේ මධ්‍යස්ථානය (1st Colombo City Branch Kirulapone Extention Center) යනුවෙන් හඳුන්වන කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇති, සණස සංවර්ධන බැංකුව (සණස ඩිවලොප්මන් බැන්ක් පී. එල්. සී.)

නඩු අංකය : HC/CIVIL/7/14/MR

............*පැමිණිලිකාර බැංකුව.*

-එදිරිව-

රෙනයිසන්ස් නිවාස පුද්ගලික සමාගම,
අංක 151,
නාවල පාර, නුගේගොඩ,
සහ/හෝ
අංක 1/ඒ-1,
පන්නිපිටිය පාර, ජයන්තිපුර,
බත්තරමුල්ල.

............*විත්තිකාර සමාගම.*

*ඉහත නම් සඳහන් විත්තිකාර සමාගම වෙතය.*

මෙම නඩුවෙහි වර්ෂ 2016ක් වූ නොවැම්බර් මස 21 වන දින ඇතුළත් කරන ලද ඒකපාර්ශ්වික තීන්දුවේ තීන්දු ප්‍රකාශය ප්‍රකාරව,

එකී වර්ෂ 2016 ක් වූ නොවැම්බර් මස 21 වන දින ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය ප්‍රකාරව පැමිණිල්ලේ වාසියට තීන්දු ප්‍රකාශ කර ඇති අතර, එකී තීන්දුව ප්‍රකාර මෙහි පහත උපල්ඛනයේ විස්තර කර ඇති දේපළ ලියා තහනමට ගෙන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා පැමිණිලිකරුට එකී තීන්දු ප්‍රකාශය ප්‍රකාරව හිමි විය යුතු රුපියල් 4,750,000 ක ණය මුදල ද, එම ණය මුදල උදෙසා වර්ෂ 2013.05.23 දින දක්වා වාර්ෂිකව 22% බැගින් වූ පොළියේ ද, එකතුව වන රුපියල් 5,161,871.22 ක මුදල ද, හා 2013.05.24 දින සිට ඉහත කී ණය මුදල සම්පූර්ණයෙන්ම විත්තිකාර සමාගමෙන් අයකර ගන්නා තුරු රුපියල් 4,750,000 ක මුදල උදෙසා වාර්ෂිකව 22% බැගින් වූ පොළී මුදලක් ද, අයකර දෙන ලෙසට නියෝග කර ඇති හෙයින්,

මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම සහ ස්ථානය එකී මුදල් ප්‍රමාණය ගෙවීම සඳහා බන්ධනය වී ඇස්කීසි කළ හැකි බවට ගරු අධිකරණය විසින් තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින්,

එලෙස තීන්දු කරන ලද ඒකපාර්ශවික තීන්දුව අනුව, විත්තිකාර සමාගම විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින්, එකී මුදල් අයකර දීම සඳහා කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ ආඥාව ප්‍රකාර මෙහි පහත සඳහන් පළමු උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම (කැබලි අංක 20) හා ඒ මත පිහිටි ගොඩනැගිලි ගහ කොළ ආදී සියලු දේ,

**වර්ෂ 2022ක් වූ දෙසැම්බර් මස 28 වන දින පෙ. ව. 10.00ට** එකී දේපළ පිහිටා ඇති උඩුගම්පොල, දෙළගත පාර, යන ස්ථානයේ දී ද,

පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, උඩුගම්පොල ප්‍රාදේශීය සභා සීමාව තුළ, අලුත්කුරු කෝරළේ දසිය පත්තුවේ උඩුගම්පොළ පිහිටි කෝන්ගහවත්ත කියන ඉඩමට (බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක මහතා විසින් වර්ෂ 2012.01.12 වන දින මැන සාදන ලද අංක 11672 දරන පිඹුරේ කැබලි අංක A දරන කොටස නැවත මැන බෙදීමට අනුව) අවසරලත් මිනින්දෝරු මර්වින් සමරනායක විසින් වර්ෂ 2012 පෙබරවාරි මස 13 වන දින මැන සාදන ලද අංක 11707 දරන පිඹුරේ කැබලි අංක 20 දරන කොටසට මායිම්, උතුරට : කැබලි අංක 28 ද, නැගෙනහිරට : කැබලි අංක 19 ද, දකුණට : කැබලි අංක 35 ද, බස්නාහිරට : කැබලි අංක 28 ද යන මායිම් වූ පර්චස් දහයයි දශම දහයයි (පර්. 10.10) විශාල ඉඩම වේ.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K 143/56 අංක දරන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

මෙහි පහත සඳහන් දෙවන උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම (කැබලි අංක 24) හා ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ ආදී සියලු දේ,

**වර්ෂ 2022ක් වූ දෙසැම්බර් මස 28 වැනි දින පෙ. ව. 11.00 ට** එකී දේපළ පිහිටා ඇති උඩුගම්පොල, දෙළගත පාර යන ස්ථානයේදී ද,

**දෙවන උපලේඛනය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ උඩුගම්පොළ ප්‍රාදේශීය සභා සීමාව තුළ අලුත්කුරු කෝරළේ දසිය පත්තුවේ උඩුගම්පොළ පිහිටි කෝන්ගහවත්ත කියන ඉඩමට (බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක මහතා විසින් වර්ෂ 2012.01.12 වන දින මැන සාදන ලද අංක 11672 දරන පිඹුරේ කැබලි අංක A දරන කොටස නැවත මැන බෙදීමට අනුව) අවසරලත් මිනින්දෝරු මර්වින් සමරනායක මහතා විසින් වර්ෂ 2012 පෙබරවාරි මස 13 වන දින මැන සාදන ලද අංක 11707 දරන පිඹුරේ කැබලි අංක 24 දරන කොටසට මායිම් උතුරට : සුනිල් පෙරේරාට සහ අනෙකුත් අයට අයත් ඉඩමද, නැගෙනහිරට : කැබලි අංක 23 ද, දකුණට : කැබලි අංක 25 හා 26 ද, බස්නාහිරට : ඩේවිඩ් සිගේරාට අයිති ඉඩමද යන මායිම් වූ පර්චස් දහයයි දශම දෙකයි බින්දුවක් (අ.0, රූ. 0, පර්. 10.20) විශාල ඉඩම වේ.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K143/57 අංක දරන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

මෙහි පහත සඳහන් තුන්වන උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම (කැබලි අංක 26) හා ඒ මත පිහිටි ගොඩනැගිලි ගහ කොළ ආදී සියලු දේ.

**වර්ෂ 2022ක් වූ දෙසැම්බර් මස 28 වැනි දින ප. ව. 12.00ට** එකී දේපළ පිහිටා ඇති උඩුගම්පොළ, දොළගත පාර යන ස්ථානයේ දී ද,

**තුන්වන උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, උඩුගම්පොළ ප්‍රාදේශීය සභා සීමාව තුළ අලුත්කුරු කෝරළේ, දසිය පත්තුවේ උඩුගම්පොළ පිහිටි කෝන්ගහවත්ත කියන ඉඩමට (බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක මහතා විසින් වර්ෂ 2012.01.12 වන දින මැන සාදන ලද අංක 11672 දරන පිඹුරේ කැබලි අංක A දරන කොටස නැවත මැන බෙදීමට අනුව) අවසරලත් මිනින්දෝරු මර්වින් සමරනායක විසින් වර්ෂ 2012 පෙබරවාරි මස 13 වන දින මැන සාදන ලද අංක 11707 දරන පිඹුරේ කැබලි අංක 26 දරන කොටසට මායිම්, උතුරට : කැබලි අංක 25 හා ඩේවිඩ් සිගේරාට අයත් ඉඩම ද, නැගෙනහිරට : කැබලි අංක 28 ද, දකුණට : කැබලි අංක 27 ද, බස්නාහිරට : නලින් පෙරේරාට අයිති ඉඩම ද, යන මායිම් වූ පර්චස් දහයයි දශම තුනයි බින්දුවක් (පර්. 10.30) විශාල ඉඩම වේ.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K/143/58 අංක දරන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

මෙහි පහත සඳහන් හතර වන උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම (කැබලි අංක 27) හා ඒ මත පිහිටි ගොඩනැගිලි ගහ කොළ ආදී සියලු දේ,

**වර්ෂ 2022ක් වූ දෙසැම්බර් මස 28 වැනි දින ප. ව. 2.00ට** එකී දේපළ පිහිටා ඇති උඩුගම්පොළ, දෙළගත පාර යන ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

**හතරවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, උඩුගම්පොළ ප්‍රාදේශීය සභා සීමාව තුළ, අලුත්කුරු කෝරළේ, දසිය පත්තුවේ උඩුගම්පොළ පිහිටි කෝන්ගහවත්ත කියන ඉඩමට (බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක මහතා විසින් වර්ෂ 2012.01.12 වන දින මැන සාදන ලද අංක 11672 දරන පිඹුරේ කැබලි අංක A දරන කොටස නැවත මැන බෙදීමට අනුව) අවසරලත් මිනින්දෝරු මර්වින් සමරනායක විසින් වර්ෂ 2012 පෙබරවාරි මස 13 වන දින මැන සාදන ලද අංක 11707 දරන පිඹුරේ කැබලි අංක 27 දරන කොටසට මායිම්, උතුරට : කැබලි අංක 26 ද, නැගෙනහිරට : කැබලි අංක 28 ද, දකුණට : කැබලි අංක 01 හා 02 ද, බස්නාහිරට : නලින් පෙරේරාට අයිති ඉඩමද, යන මායිම් වූ පර්චස් දහයයි දශම හතරයි බින්දුවක් (පර්. 10.40) විශාල ඉඩම වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K 410/80 අංක දරණ පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

ඉහත කී දේපල කොටස් පහත සඳහන් ඉඩමෙන් බෙද වෙන් කරන ලදී.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ උඩුගම්පොළ ප්‍රාදේශීය සභා සීමාව තුළ අලුත්කුරු කෝරළේ දසිය පත්තුවේ උඩුගම්පොළ පිහිටි කෝන්ගහවත්ත කියන ඉඩමට (බලයලත් මිනින්දෝරු වී. එෆ්. ජේ. ප්‍රනාන්දු මහතා විසින් වර්ෂ 1978.11.14 වන දින මැන සාදන ලද අංක 6796 A දරන පිඹුරේ කැබලි අංක A දරන කොටස නැවත මැන බෙදීමට අනුව) අවසරලත් මිනින්දෝරු මර්වින් සමරනායක විසින් වර්ෂ 2012 ජනවාරි මස 12 වන දින මැන සාදන ලද අංක 11672 දරන පිඹුරේ කැබලි අංක A දරන කොටසට මායිම් උතුරට : සුනිල් පෙරේරාට හා අනෙකුත් අයට අයත් ඉඩම ද, නැගෙනහිරට : මෙම ඉඩමේ කොටසක් වන 11672 දරන පිඹුරේ කැබලි අංක B ද, දකුණට : එක්සත් මාවත (පවතින පාර) එම්. ජේ සී. පෙරේරාට අයිති ඉඩමද, බස්නාහිරට : නලින් පෙරේරාට හා ඩේවිඩ් සිගේරාට අයිති ඉඩම ද, යන මායිම් වූ අක්කර දෙකයි පර්චස් හයයි දශම එකයි (අ. 2, රූ. 0, පර්. 6.1) විශාල ඉඩම වේ.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A468/104 අංක දරන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

1. මුළු ගැණුම් මිලෙන් 25%ක මුදලක් ද,
2. සිවිල් නඩු විධාන සංග්‍රහයෙ 258(අ) වගන්තිය යටතේ අයකිරීම් ද,

(ඉහත සඳහන් ගෙවීම් සෑම බිම් කොටසකටම වෙන් වශයෙන් ගෙවිය යුතුය.)

විකිණීම අවසන් වූ වහාම මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25%ක මුදලක් පමණක් නම්, ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75%ක මුදල දින 30ක් ඇතුළත කොළඹ, වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

*දේපළට පිවිසීම* : ගම්පහ නගරයේ සිට මිනුවන්ගොඩ මාර්ගයේ උඩුගම්පොළ මංසන්ධියෙන් වම් පසට ඇති කොටුගොඩ මාර්ගයේ කි. මී. 1ක් පමණ ඉදිරියට ගොස් සෙනරත් පරණවිතාන පාසල ඉදිරියෙන් ඇති දෙළගත පාරේ මීටර් 700 ක් පමණ ඉදිරියට ගොස් වම් පස ඇති වරිපනම් අංක 89 A දරන නිවස ඉදිරියෙන් ඇති පාරට හැරී මීටර් 300ක් පමණ ඉදිරියට ගිය පසු වම්පස මෙම කැබලි කරන ලද ඉඩම පිහිටා ඇත.

ආර්. කේ. ගාමිණී වීරසිරි, B. Com (SPL)
අධිකරණ රෙජිස්ට්‍රාර් - නියෝජ්‍ය පිස්කල්.
සාම විනිසුරු (මුළු දිවයිනටම)
වාණිජ මහාධිකරණය,
කොළඹ 12.

වර්ෂ 2022 ක් වූ දෙසැම්බර් මස 05 වැනි දින,
කොළඹ, වාණිජ මහාධිකරණයේ දීය.

12-436/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.